**නැගෙනහිර පළාතේ පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට පාසල් පාදක ක්‍රමය මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017**

නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට පාසල් පාදක ක්‍රමය මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2017.08.18** වේ.

**01. යෝග්‍යතා ඃ-**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

iii. **2017.08.18** වන දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන අවුරුදු පහක් (05) තුළ අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

**හෝ**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන අවුරුදු පහක් (05) තුළ අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචිව සිටින අයෙකු සමග ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණ ඒ බව සනාථ කළ හැකි ලේඛණ ඉදිරිපත් කළ හැකි අයෙකු විය යුතුය.

සටහන - **නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බව සනාථ කිරීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු පහක (05) ඡන්ද හිමි නාමලේඛණ සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

**1.2 අධ්‍යාපන සුදුසුකම්**

**2017.08.18** වන දිනට හෝ ඊදිනට පෙර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය(SLIATE) විසින් පිරිනමනු ලබන ජාතික/උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව (HND in English) සමග පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

i. අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (03) සමත් වීම.
(නව විෂය නිර්දේශය යටතේ පවතින සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය උසස් පෙළ විෂයයක් ලෙස සලකනු නොලැබේ.)

**සහ**

ii. අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාවට සහ තවත් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව මවුබස හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව තිබීම. එක් වරකදී විෂයයන් 05 ක් සමත්ව තිබීම අනිවාර්ය වේ.

**ජාතික/උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය සමග අ.පො.ස.(සා.පෙළ) සහ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවීම අනිවාර්ය වන අතර, එසේ අමුණා එවනු නොලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් හෝ පැමිණිලි සලකා බලනු නොලැබේ.**

**02. බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි ඃ-**

2.1 දැනට ශ්‍රී ලංකා ගුරු සේවයේ නියුතුවූවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ. එවැනි අය අයදුම්පත් යොමු කිරීම වරදක් සේ සලකනු ලැබේ.

2.2 සෑම අයදුම්කරුවෙකුම ප්‍රායෝගික පරීක්ෂණයේදී, ඉංග්‍රීසි විෂයය ඉගැන්වීම පිළිබඳව ප්‍රමාණවත් කුසලතාවයක් ප්‍රදර්ශනය කළ යුතුය.

2.3 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයකට කැඳවා, මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබයි. එහිදී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලබයි. ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව, පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ.(සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.)

2.3.1 පුරප්පාඩු සංඛ්‍යාව හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මත ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත. පාසල් පාදක ක්‍රමය අනුව එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක ප්‍රමුඛතාවය අහඹු ලෙස ලබාගෙන පාසල් තෝරා ගැනීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

2.3.2 සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වී, එහෙත් පාසලක් හිමි නොවූ අයදුම්කරුවන් සඳහා පුරප්පාඩු පුරවා නොමැති පාසල්වලට පත්කිරීම පිළිබඳව අවසාන තීරණය නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්වරයාගේ එකඟතාවය මත නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතුය.

2.4 පුරප්පාඩු සහිත පාසල් විස්තර

| අනුක්‍රමික අංකය | මාධ්‍යය | පුරප්පාඩු පවතින පාසල් |
|---|---|---|
| 1 | සිංහල (Sinhala) | **ඇමුණුම** 1 (Annexure 1) |
| 2 | දෙමළ (Tamil) | **ඇමුණුම** 2 (Annexure 2) |

2.5 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන වන බැවින්, වසර 10 ක් ගත වනතුරු ස්ථාන මාරු සඳහා සලකා බලනු නොලැබේ. මේ පිළිබඳව සේවා ගිවිසුමක් ඇති කර ගැනීමට අවශ්‍ය යැයි පත්කිරීම් බලධාරියා හෝ පරිපාලන බලධාරියා තීරණය කරනු ලබන්නේ නම් ඒ සඳහා එකඟ විය යුතුය.

2.6 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද, යටත්ව තෝරා ගනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 03/2016 අනුව වන අතර මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය G.E.-1-2016 දරණ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 27,740-300x6-380x7-445x2 රු. 33,090/- වේ. ඩිප්ලෝමාධාරීන් මෙම වැටුප් පරිමාණයේ 07 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

2.7 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.8 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකඃ 1885/38, දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

## 03. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-

3.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 10.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

3.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති,නිවැරදිව සම්පූර්ණ කර නොමැති හා**

**සහතිකවල පිටපත් අමුණා නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

3.3 **එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.** අයදුම්පතෙහි තම මනාප අනුපිළිවෙල අනුව, ඉල්ලුම් කරනු ලබන පාසල් 03 ක් පමණක් සටහන් කළ යුතු අතර, සිංහල මාධ්‍ය අයදුම්කරුවන් ඇමුණුම 01 අනුවද දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් ඇමුණුම 02 අනුවද පාසල් තෝරා ගත යුතුය.

3.4 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් අයදුම්කරන්නේ නම්, අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සමඟ එවිය යුතුය.

3.5 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2017.08.18** වන දිනට හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි කල කුවිතාන්සිය ළඟ තබා ගැනීම මතුවට ප්‍රයෝජනවත් විය හැක. (අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංකඃ 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.

3.6 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" EX/Rec/17/17"** යන්න සඳහන් කළ යුතුය.

3.7 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමේදී දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත සුදුසුකම් ඇති අය තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් එම අය නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟතාවය පළ කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ නොවී හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත නොකළ අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන රජයේ සේවයේ නියුතු අය මෙම තනතුරට තෝරා ගතහොත් පළාත් රාජ්‍ය සේවයේ නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**04.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**05. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**06. ප්‍රායෝගික පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| ***ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| (i) අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| (ii) පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| (iii) සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| (iv) කාල කළමනාකරණය | 05 | 02 |
| (v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම | 05 | 02 |
| ***මුළු ලකුණු ප්‍රමාණය*** | ***25*** | ***10*** |

**07.** ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යවනු ලබන අතර, www.ep.gov.lk වෙබ් අඩවියේද ප්‍රසිද්ධ කරනු ඇත.

**08.** සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

**09.** සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**10.** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ බලයද, පත්කිරීම් සම්බන්ධයෙන් පැනනැගිය හැකි ගැටලු පිළිබඳවද, යම් විශේෂ හේතුවක් මත සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට සිදුවුවහොත් ඒ පිළිබඳව අවසාන තීරණයද, කිසියම් පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හෝ මුළුමණින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳවද, ඩිප්ලෝමාවක වලංගුභාවය සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය ද, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශය මත නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.